# සිංහල භාෂාව හා සාහිත්‍යය
# 7 ශ්‍රේණිය



## 21. පාඩම

## පුස්තකාලයට පිය නගමු.

2.0 නිපුණතාව

ජීවන අත්දැකීම් පුළුල් කර ගැනීම සඳහා කියවීමේ පුරුදු අර්ථවත් ව යොදා ගනියි.

2.3 නිපුණතා මට්ටම

නිශ්ශබ්ද ව කියවා අවබෝධ කර ගත් කරුණු ඉදිරිපත් කරයි.

# ක්‍රියාකාරකම 01

- පහත සඳහන් ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

1. පුස්තකාලය යනු කුමක්දැයි කෙටියෙන් හඳුන්වන්න.

..........................................................................................................

..........................................................................................................

2. 'පුස්තකාලය' යන වචනය සෑදී ඇත්තේ කෙසේ ද?

..........................................................................................................

3. අතීතයේ දී පුස්තකාලය හඳුන්වා ඇත්තේ කෙසේ ද?

..........................................................................................................

4. පුස්තකාලයක පොත් එක් එක් විෂයය අනුව වර්ග කර තැබීමේ ක්‍රමයක් තිබේ. එකී ක්‍රමය හඳුන්වන්නේ කුමන නමකින් ද?

..........................................................................................................

5. පොත්පත් කියවීමේ වැදගත්කම සම්බන්ධයෙන් මාර්ටින් වික්‍රමසිංහයන් ප්‍රකාශ කරන්නේ කුමක් ද?

..........................................................................................................

6. පාඩමේ සඳහන් වන ලේඛකයින්ගේ නම් ලියන්න.

..........................................................................................................

7. පාඩමට අනුව ළමයින් පුස්තකාලයට ගොස් තෝරාගත් පොත් මොනවා ද?

..........................................................................................................

8. අන්ධව සිටිය දීත් (සිය සොයුරිය සහ ඇගේ දුව ලවා පිටපත් කරවා) ග්‍රන්ථ 16ක් ම එළිදැක් වූ ලේඛකයා කවුද?

..........................................................................................................

## ක්‍රියාකාරකම 02

- පහත සඳහන් ප්‍රකාශ නිවැරදි නම් (✓) ලකුණ ද වැරදි නම් (✗) ලකුණ ද යොදන්න.

1. ජාතික පුස්තකාල පවතින්නේ එක් රටකට එකක් පමණි. (   )
2. කියවීම පටන් ගැනීමට පෙර ගුරුතුමිය සිසුන් ඇමතුවා ය. (   )
3. ශිෂ්‍යයින්ට ඔවුන් කැමති පොත් අදාළ රාක්ක වෙත ගොස් තෝරා ගැනීමට සහය වූයේ ගුරුතුමිය පමණි. (   )
4. එක් එක් වර්ගය යටතේ පොත් පුස්තකාලයේ අසුරා ඇත. (   )
5. පාසල් කාල පරිච්ඡේද තුනක් ම සිසුහු පොත් පරිශීලනය කළහ.(   )

6. පියාගේ අභාවයෙන් පසුව ජී.බී. සේනානායකයන්ගේ පාසල වූයේ කොළඹ මහජන පුස්තකාලය යි. (    )

7. 'අපි විවේකය ප්‍රයෝජනවත් ව ගත කිරීමට පුරුදු වුණා.' ගුරුවරු එක හඬින් කීහ. (    )

8. ඊළඟ සතියේ පුස්තකාලයට වෙන් වූ කාල පරිච්ඡේදය පොත්පත් ලියූ උගතුන් ගැන විස්තර කියා දීමට වෙන් විය. (    )

9. 'මඩොල්දූව' ජී.බී. සේනානායකයන්ගේ කෘතියකි. (    )

10. පාසලේ දී අර්ථවත් ව, ඵලදායී ලෙස කාලය ගත කිරීමට හොඳ ම තැන පුස්තකාලය යි. (    )

# ක්‍රියාකාරකම 03

- පහත සඳහන් ලේඛකයින් රචනා කළ ග්‍රන්ථ හතර බැගින් නම් කරන්න.

1. මාර්ටින් වික්‍රමසිංහ 

2. එදිරිවීර සරච්චන්ද්‍ර 

3. ගුණදාස අමරසේකර 

4. ජී.බී. සේනානායක 

5. මහගම සේකර 

## ක්‍රියාකාරකම 04

- පහත සඳහන් යෙදුම්වලට ගැළපෙන තනිපද වරහන් තුළින් තෝරා ලියන්න.

1. රජතුමා වාසය කරන නිවස - ........................................
2. වනයෙහි හැසිරෙන - ........................................
3. වනයෙහි වාසය කරන - ........................................
4. ජලයෙහි හැසිරෙන - ........................................
5. අනුන්ට උදව් කරන - ........................................

6. උඩඟු කමක් නැති - ........................................

7. වනයෙහි ඉබේ හට ගන්නා ගින්න - ........................................

8. කරන ලද උපකාරයට උපකාර කිරීම- ........................................

9. වැසි නොලැබෙන කාලය - ........................................

10. අහස සහ මුහුද එකට ගැටෙන සේ පෙනෙන තැන -

......................................

( ක්ෂිතිජය, වනවාසී, ප්‍රත්‍යුපකාරය, පරෝපකාර, මාලිගය, ළැව් ගින්න, ජලචර, ඉඩෝරය, වනචාරී, නිහතමානී)

## ක්‍රියාකාරකම 05

- පහත සඳහන් රූඩිවලට ගැළපෙන අදහස වරහනින් තෝරන්න.

1. කසුකුසුව - ..............................................................................
2. කුම්මැහි - ..............................................................................
3. ගජබින්න - ..............................................................................
4. ගජවාසිය - ..............................................................................
5. ගජසමතා - ..............................................................................

6. ගජරාමෙට වැඩ - ......................................................................................

7. ගජ පෝසතා - ......................................................................................

8. ගෝරනාඩුව - ......................................................................................

9. ගොම්මන් වෙලාව - ..................................................................................

10. ගොරහැඩි - ......................................................................................

(ඇඳිරි වැටෙන වෙලාව, ලොකු ලාභයක්, ඉතා පොහොසත්, හොර රහසේ කෙරෙන කතාබහ, රළු/ගොරෝසු, ලෝභ, කෑගැහිල්ල, අති දක්ෂයා. බොහෝ උනන්දුවෙන් හා මහන්සියෙන් වැඩ කිරීම, ලොකු බොරු)

# ක්‍රියාකාරකම 01 - පිළිතුරු

1. පොත්පත් සඟරා ඇතුළු තොරතුරු මූලාශ්‍ර තැන්පත් කර ඇති ස්ථානය පුස්තකාලය වේ.
2. පුස්තක + ආලය
3. පොත්ගුල නමින්
4. ඩිවි දශම වර්ගීකරණය
5. ඇතැම් විට මනුෂ්‍යයෙක් වසර සියයක් ජීවත් වුව ද ලබා ගත නො හැකි දැනුම් සම්භාරයක් සහ අත්දැකීම් ගොන්නක් එක් පොතක් කියවීමෙන් ලද හැකි වෙයි.
6. මාර්ටින් වික්‍රමසිංහ, කුමාරතුංග මුනිදාස, එස්. මහින්ද හිමි, ටී.බී. ඉලංගරත්න, ජී.බී. සේනානායක
7. මඩොල්දූව, අපේගම, හීන්සැරය, හත්පණ, මඟුල් කෑම, නිදහසේ මන්ත්‍රය, අඹ යහළුවෝ සහ රත් හඳුන් රූපය
8. ජී.බී. සේනානායක

## ක්‍රියාකාරකම 02 - පිළිතුරු

1. ජාතික පුස්තකාල පවතින්නේ එක් රටකට එකක් පමණි. ( ✓ )

2. කියවීම පටන් ගැනීමට පෙර ගුරුතුමිය සිසුන් ඇමතුවා ය. ( ✓ )

3. ශිෂ්‍යයින්ට ඔවුන් කැමති පොත් අදාළ රාක්ක වෙත ගොස් තෝරා ගැනීමට සහය වූයේ ගුරුතුමිය පමණි. ( ✗ )

4. එක් එක් වර්ගය යටතේ පොත් පුස්තකාලයේ අසුරා ඇත. ( ✓ )

5. පාසල් කාල පරිච්ඡේද තුනක් ම සිසුහු පොත් පරිශීලනය කළහ.( ✗ )

6. පියාගේ අභාවයෙන් පසුව ජී.බී. සේනානායකයන්ගේ පාසල වූයේ කොළඹ මහජන පුස්තකාලය යි. ( ✓ )

7. 'අපි විවේකය ප්‍රයෝජනවත් ව ගත කිරීමට පුරුදු වුණා.' ගුරුවරු එක හඬින් කීහ. ( ✗ )

8. ඊළඟ සතියේ පුස්තකාලයට වෙන් වූ කාල පරිච්ඡේදය පොත්පත් ලියූ උගතුන් ගැන විස්තර කියා දීමට වෙන් විය. ( ✓ )

9. 'මඩොල්දූව' ජී.බී. සේනානායකයන්ගේ කෘතියකි. ( ✓ )

10. පාසලේ දී අර්ථවත් ව, ඵලදායී ලෙස කාලය ගත කිරීමට හොඳ ම තැන පුස්තකාලය යි. ( ✓ )

# ක්‍රියාකාරකම 03 - පිළිතුරු

1. මාර්ටින් වික්‍රමසිංහ
   ගම්පෙරළිය, යුගාන්තය, කලියුගය, මඩොල්දූව
2. එදිරිවීර සරච්චන්ද්‍ර
   කල්පනා ලෝකය, මළගිය ඇත්තෝ, මළවුන්ගේ අවුරුදු දා, විලාසිනියකගේ ප්‍රේමය
3. ගුණදාස අමරසේකර
   යළි උපන්නෙමි, කරුමක්කාරයෝ, රතු රෝස මල, ගල් පිළිමය හා බොල් පිළිමය
4. ජී.බී. සේනානායක
   විනිවිදිමි අඳුර, වරදත්ත, පලිගැනීම, දුප්පතුන් නැති ලෝකය
5. මහගමසේකර
   සක්වා ලිහිණි, ප්‍රබුද්ධ, තුංමංහංදිය, මනෝමන්දිර

# ක්‍රියාකාරකම 04 - පිළිතුරු

| | |
|---|---|
| 1. රජතුමා වාසය කරන නිවස | - මාලිගය |
| 2. වනයෙහි හැසිරෙන | - වනචාරී |
| 3. වනයෙහි වාසය කරන | - වනවාසී |
| 4. ජලයෙහි හැසිරෙන | - ජලචර |
| 5. අනුන්ට උදව් කරන | - පරෝපකාර |
| 6. උඩඟු කමක් නැති | - නිහතමානී |
| 7. වනයෙහි ඉබේ හට ගන්නා ගින්න | - ළැව් ගින්න |
| 8. කරන ලද උපකාරයට උපකාර කිරීම | - ප්‍රත්‍යුපකාරය |
| 9. වැසි නොලැබෙන කාලය | - ඉඩෝරය |
| 10. අහස සහ මුහුද එකට ගෑවෙන සේ පෙනෙන තැන | - ක්ෂිතිජය |

# ක්‍රියාකාරකම 05 - පිළිතුරු

1. කසුකුසුව - හොර රහසේ කෙරෙන කතාබහ
2. කුම්මැහි - ලෝභ
3. ගජ බින්න - ලොකු බොරු
4. ගජ වාසිය - ලොකු ලාභයක්
5. ගජ සමතා - අති දක්ෂයා
6. ගජ පෝසතා - ඉතා පොහොසත්
7. ගෝරනාඩුව - කෑගැහිල්ල
8. ගොම්මන් වෙලාව - ඇඳිරි වැටෙන වෙලාව
9. ගොරහැඩි - රළු/ගොරෝසු
10. ගජරාමෙට වැඩ - බොහෝ උනන්දුවෙන් හා මහන්සියෙන් වැඩ කිරීම

සැකසුම - මහේන්ද්‍ර මද්දේගම
චන්ද්‍රරතන විද්‍යාලය, කැලණිය